# පෙරවදන

මනා ඉගෙනුමක් ලැබූ ගුණ නැණ සපිරි මිනිස් කැලකට, ලෝකය වඩාත් සුන්දර ස්ථානයක් බවට පත් කළ හැකි ය. එබැවින් රටක අධ්‍යාපනය වඩාත් බලසම්පන්න කිරීමට නිති වෙහෙසිය යුතු ය. අපගේ අධ්‍යාපන ක්‍රමවේද සමඟ විශ්ව ගම්මානය වෙත දිනපතා එක්වන වටිනා හා සාරවත් අසීමිත නව දැනුම ද ගළපා ගත යුතුව ඇත. මේ නව්‍ය ප්‍රවණතා විෂයෙහි ද සාවධාන වෙමින් යහපත් ශිෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය කිරීමේ මාහැඟි සත්කාර්යයට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය අප දෙපාර්තමේන්තුවේ අරමුණයි.

පෙළපොතක් යනු අපූරු නිමැවුමකි. එය දැනුමෙන් හා වින්දනයෙන් පොහොසත් විශ්වීය පුරවැසියන් නිර්මාණය කිරීමට මඟ එළි දල්වන මහා පහන් ටැඹක් බඳු ය. නිදහස් අධ්‍යාපනයේ අනගි තිළිණයක් ලෙස මේ පාඨ ග්‍රන්ථ නොමිලේ ඔබ දෝතට පිරිනැමේ. ඒ වෙනුවෙන් රජය වැය කළ මහා ධනයට අගයක් එක්කිරීමේ වගකීම ඔබ වෙත පැවරී ඇත. මේ පෙළපොත මනාව පරිශීලනය කරමින් හා රැකගනිමින්, පරිපූර්ණ පුරවැසියකු ලෙසින් හෙට ලොවට පියමනින්නට ඔබ සැමට හැකිවේවායි සුබ පතමි.

මේ පෙළපොත ඔබ අතට පත්කිරීමේ සත්කාර්යය වෙනුවෙන් දායක වූ ලේඛක හා සංස්කාරක මණ්ඩල පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පළකරමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2020. 05. 20

